# සිවිල් යුද සමයේ අඩාල වූ ජන ජීවිත නඟා සිටුවීමෙහිලා රාජ්‍ය ප්‍රතිපත්තියෙහි ක්‍රියාත්මක භාවයඃ අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල බල ප්‍රදේශය ආශ්‍රයෙන්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***ඩබ්.එම්. අනුපමා නිල්මිණී වීරසේකර*** [1]
***එම්.කේ. නදීකා දමයන්ති*** [2]

**සංක්ෂේපය**

වසර තිහක බිහිසුණු අවි සංග්‍රාමයක සමාප්තිය 2009 වර්ෂයේ මැයි මස 18 වන දින සනිටුහන් කරන අවස්ථාවේ යුද්ධයෙන් හෙම්බත්ව සිටි උතුරු නැගෙනහිර ජනතාව සාමයේ අරුණලු මතින් දුටුවේ තම ජීවන තත්ත්වයෙහි සශ්‍රීකත්වයයි. වර්තමානය වන විට යුද්ධය නිමාවී වසර හයක් නික්ම යාමට ආසන්නය. එබැවින් ඔවුන් බලාපොරොත්තු වූ ජීවන තත්ත්වයෙහි වර්ධනය අද වන විට එම ජනතාව සතු වන්නේ ද? යන්න විමසා බැලිය යුත්තකි. සිවිල් යුද්ධයෙන් පීඩාවිඳි ජනතාව ඉන් මුදවාලනු වස් පශ්චාත් යුද කාලීනව රාජ්‍ය ප්‍රතිපත්තිය මඟින් සපයා ඇති දායකත්වයෙහි සාධනීය මට්ටම විමර්ෂණය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳව වූ කතිකාවත පුළුල් පරාසයක පැතිර පවතින අතර 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයෙහි අඩංගු රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම තුළ දැක්වෙන 27(2)(ඇ) ව්‍යවස්ථාවෙහි සඳහන් " ප්‍රමාණවත් ජීවන මට්ටමක් සියලු පුරවැසියන් වෙත අත්කර දීම" යන ප්‍රතිපත්තියේ ක්‍රියාත්මකභාවය පමණක් මෙමඟින් අධ්‍යයනයට බඳුන් වේ. අධ්‍යයන නියැදිය තෝරා ගැනීමේදී විනිශ්චය නියැදුම් ක්‍රමය (Purposive sampling) භාවිත කරනු ලැබිණි. නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ පානම පත්තුව (ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරා ගනු ලැබිණි. නියැදිය ලෙසින් පානම ගම්මානයේ පානම උතුර, පානම දකුණ, පානම මධ්‍යම, පානම බටහිර හා ශාස්ත්‍රවෙල ග්‍රාම නිලධාරී වසම් පහෙන් පුද්ගලයන් 100ක් අධ්‍යයනය සඳහා අහඹු ලෙස තෝරාගනු ලැබීය. ඒ අනුව නිගාමී පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරමින් නියැදියෙන් සියයක් ප්‍රශ්නාවලි ක්‍රමවේදයට සහ හතළිහක් සම්මුඛ සාකච්ඡා සඳහා බඳුන් කරන ලදී. සමීක්ෂණ දත්තවලට අනුව ප්‍රතිචාරීන්ගෙන් 48%ක මතය ජන ජීවිත නඟා සිටුවීම සම්බන්ධයෙන් රජයේ දායකත්වය සෑහීමකට පත්විය නොහැකි බවයි. නියැදියට ඇතුළත් වූ 40% රාජ්‍ය මැදිහත්වීම සම්බන්ධයෙන් මධ්‍යස්ථ මතයක් දැරූ අතර 10%ක් රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව තම තෘප්තිමත් භාවය ප්‍රකාශ කර සිටියහ. ඒ අනුව නිගමනය කළ හැක්කේ පශ්චාත් යුද සමයේ අඩාල වූ ජන ජීවිත නඟා සිටුවීම සම්බන්ධයෙන් ග්‍රාමීය වශයෙන් රාජ්‍ය ප්‍රතිපත්තියෙහි ක්‍රියාත්මකභාවය මන්දගාමී ස්වරූපයක් උසුලන බවයි. මෙයට අමතරව ක්‍රියාත්මක වන්නා වූ රාජ්‍ය ප්‍රතිපත්තීන් තුළින් ද නව ගැටලු උද්ගතව ඇති බව මෙම සමීක්ෂණය තුළින් අනාවරණය විය.

**ප්‍රමුඛ පදඃ පශ්චාත් යුද සමය, රාජ්‍ය ප්‍රතිපත්ති, ජීවන තත්ත්වය, ලාහුගල, අම්පාර දිස්ත්‍රික්කය**

*1 ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැළණිය විශ්වවිද්‍යාලය*

*2 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැළණිය විශ්වවිද්‍යාලය*